# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1979/25 – 2016 අගෝස්තු 09 වැනි අඟහරුවාදා – 2016.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 158 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2015/NRD/217.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: MTR/LND/ACQUI/L2/3978.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2016 අගෝස්තු මස 03 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මාතර.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර කඩවත් සතර සුළු කොට්ඨාසයේ, තල්පාවිල උතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2016.03.16 දින පිළියෙළ කරන ලද ප්‍රගමන අනුරේඛන අංක MR/MTR/2015/535හි කැබලි අක්ෂර 'ඒ' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0555ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – හිල්ක්‍රෙස්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0555**

උතුරට: මාර්ගය සහ එම්. බී. සිරිමාවතී හිමිකම් කියන හිල්ක්‍රෙස්ට්වත්ත; නැගෙනහිරට: කේ. කේ. රංජිත්ලාල් හිමිකම් කියන සිල්වර්ඩේල්වත්ත සහ මාතර-කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; දකුණට: මාතර-කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; බටහිරට: නන්දාවතී මහමුල්ලගේ හිමිකම් කියන හිල්ක්‍රෙස්ට්වත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි හිල්ක්‍රෙස්ට්වත්ත.

08 - 663

1A – G24009 – 22 (2016/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*